# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authorty

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/06/EPU/PR/37/2022
ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref.
දිනය / திகதி / Date 2022.01.25

## මාධ්‍ය නිවේදනය

**බස්නාහිර පළාතේ ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක් රැස් කිරීමට මධ්‍යම පරිසර අධිකාරියෙන් දින දෙකක්.....**

බස්නාහිර පළාතේ ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක් රැස් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් දින දෙකක් නම් කරමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. "විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ගංදිය රැකුමෙන් මිහිලිය රැකගමු" යන තේමාව යටතේ මෙම වැඩසටහන දියත් කරයි. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය නිසි කළමනාකාරීත්වයකින් යුතුව බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වරින් වර වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එහි එක් පියවරක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාවට නංවනු ලැබේ.

ඒ අනුව, 2022 ජනවාරි 28 සහ 29 යන දෙදින බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කවල මධ්‍යස්ථාන 40ක දී ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක් රැස් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. නිවෙස්වල ඇති විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය උක්ත දිනයන්හි දී පෙ.ව. 9.00 සිට ප.ව. 4.30 දක්වා කාලයේ දී එම මධ්‍යස්ථාන වෙත ගෙනැවිත් භාරදීම සඳහා මහජනතාවට මෙහි දී අවස්ථාව සැලසේ.

බත්තරමුල්ල - මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, හයිඩ්පාක් ක්‍රීඩාංගනය, පාක්වීදිය - ක්ලීන්ටෙක් පුද්ගලික ආයතනයේ එකතුකිරීමේ මධ්‍යස්ථානය, මාලිගාකන්ද - ක්ලීන්ටෙක් පුද්ගලික ආයතනයේ එකතුකිරීමේ මධ්‍යස්ථානය, මුතුවැල්ල ක්‍රීඩාංගනය, කඩුවෙල - කොතලාවල මහා විද්‍යාල ක්‍රීඩාංගනය, ඔරුවල කණිෂ්ඨ විද්‍යාලය, කෝට්ටේ මහනගර සභාව, කලල්ගොඩ - තලවතුගොඩ ශ්‍රීපානී ප්‍රජාශාලාව, හෝමාගම - හබරකඩ - කොතලාවල ක්‍රීඩාංගනය, මත්තෙගොඩ ප්‍රධාන බස් නැවතුම, රත්මලාන - කොතලාවලපුර මහා විද්‍යාලය ඉදිරිපිට ක්‍රීඩාංගනය, මොරටුව - අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානය, දෙහිවල එස් ද එස් ජයසිංහ ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය පිටුපස පරිශ්‍රය, මඩපාත අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය, කොළොන්නාව නගර සභාව සහ අවිස්සාවේල්ල නගර සභාව ඉදිරිපිට ක්‍රීඩාංගනය යන ස්ථානයන් හි පිහිටුවා ඇති මධ්‍යස්ථාන 17 දී කොළඹ දිස්ත්‍රික්කයට අදාළව විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එකතු කිරීම සිදුකරයි.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ මධ්‍යස්ථාන 13ක දී විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක්රැස් කරයි. මීරිගම මහජන ක්‍රීඩාංගනය, කැලණිය ප්‍රාදේශීය සභාව, මිනුවන්ගොඩ උඩුගම්පල පතහවත්ත ක්‍රීඩාංගනය, මහර ප්‍රාදේශීය සභාව, ගම්පහ මුදුන්ගොඩ ක්‍රීඩාංගනය, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව, බියගම ප්‍රාදේශීය සභාව, දොම්පේ ප්‍රාදේශීය සභාව, මීගමුව මහනගර සභාව, වත්තල ප්‍රාදේශීය සභාව, ජාඇල ප්‍රාදේශීය




| Chairman | Tel : 2872361, 2872348 Fax : 2872347 | Director General | Tel : 2872359 Fax : 2872608 | General Office | Tel : 2872278, 2873447, 2872419, 7877277-280 | Complaint : 2888999 Emergency Hot Line : 1981 |
|---|---|---|---|---|---|---|
| D.D.G | HRD. Admin. & Finance Tel : 2865296 Fax: 2877515 | Envt. Pollution Control Tel : 2873453 Fax : 2872605 | Envt. Mgt. & Assess. Tel : 2872388 Fax: 2872296 | Envt. Edu. & Awareness Tel : 2872297 Fax : 2872609 | Waste Mgt. Te. 2872409 Fax: 2882152 | Regional Oper. Tel : 2872370 |

පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு | Ministry Of Environment

සභාව, කටාන ප්‍රාදේශීය සභාව සහ නිට්ටඹුව මහජන ක්‍රීඩාංගනය යන ස්ථානවල ගම්පහ දිස්ත්‍රික්කයට අදාළව මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

හොරණ ප්‍රාදේශීය සභා උපකාර්යාලය (ඉංගිරිය), හොරණ නගර සභාව, මතුගම ප්‍රාදේශීය සභාව, බේරුවල නගර සභාව, පානදුර නගර සභාව, නාගොඩ - මිහිසුරු කාබනික පොහොර මධ්‍යස්ථානය, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සම්පත් කේන්ද්‍රය (පමුණුගම), දොඩංගොඩ ප්‍රාදේශීය සභාව, වාද්දුව ප්‍රාදේශීය සභාව සහ බේරුවල ප්‍රාදේශීය සභාව යන ස්ථාන 10 දී කළුතර දිස්ත්‍රික්කයට අදාළව විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එකතු කිරීම සිදුකරයි. මධ්‍යම පරිසර අධිකාරියේ **ක්ෂණික දුරකථන අංකය වන 1981** ඇමතීම මගින් විද්‍යුත් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන පිළිබඳ වැඩිදුර විස්තර ලබාගත හැකිය.

කොටස් කර ඇති හෝ අභ්‍යන්තර කොටස් ගලවා ඇති විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ ද පස්, වැලි හා මඩ තැවරී ඇති විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ ද හැර අනෙකුත් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය උක්ත මධ්‍යස්ථානවල දී භාර ගනු ලැබේ. එලෙසම කර්මාන්තායතන, වෙළෙඳසැල් මගින් විශාල ප්‍රමාණවලින් ගෙන එනු ලබන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය මෙම වැඩසටහනේ දී භාර නොගන්නා අතර ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය පමණක් භාර ගනු ලැබේ. භාර ගන්නා සහ භාර නොගන්නා විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය සවිස්තර නාම ලේඛනය මේ සමඟ අමුණා ඇත.

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හා නිසි පරිදි බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබාදෙන උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර ලාභී ආයතන හරහා පමණක් මෙලෙස එක්රැස් කරනු ලබන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය අපහරණය කිරීම සිදු කරයි. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය ආරක්ෂිත ලෙස කොටස්වලට වෙන්කර ශ්‍රී ලංකාව තුළ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ප්ලාස්ටික්, යකඩ වැනි කොටස් මෙරට දී ප්‍රතිචක්‍රීකරණයට යොමු කරනු ලබන අතර ඉතිරි කොටස් අදාළ ප්‍රතිචක්‍රීකරණ හා නිෂ්කර්ෂණ පහසුකම් සහිත රටවලට අපනයනය කරනු ලැබේ. එහිදී ජාත්‍යන්තර සම්මුතීන්ට (බාසල් සම්මුතියට) අනුකූලව මෙම අපනයන කටයුතු සිදුකරනු ලැබේ.

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එකතු කිරීම හා කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබාදෙන උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන බලපත්‍රය සහිත ආයතන 11ක් මෙවර ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ වැඩසටහන සමඟ අත්වැල් බැදගෙන සිටී. එම ආයතන 11 සමඟ මධ්‍යම පරිසර අධිකාරිය මෙම වැඩසටහනට අදාළව අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම මාධ්‍ය හමුව පැවැත්වීමට (ජනවාරි 25) සමගාමීව සිදුකිරීමට කටයුතු යොදා ඇත. එකතු කරනු ලබන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතීන්ට අනුකූලව පරිසරයට හානියක් නොවන පරිදි නියමිත ක්‍රමවේද භාවිත කරමින් අපහරණය කරන බවට සහතික වෙමින් එම අවබෝධතා ගිවිසුම් අත්සන් කරනු ලැබේ.

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර නොකිරීම මගින් මිනිසුන්ට, සත්වයින්ට, ශාකවලට මෙන්ම පරිසරයට ද සිදුවන හානිය අවම කිරීමේ අරමුණින් ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ මෙම වැඩසටහන සංවිධාන කර ඇත. භාවිතයේ පහසුව සහ තම කාර්යයන් පහසුකර ගැනීම සඳහා මිනිසුන් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ භාවිතයට ප්‍රියකරයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ භාවිතය ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති අතර දිනෙන් දින විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ භාවිතයේ ප්‍රවණතාව ද වැඩිවෙමින් පවතී. එලෙසම, අතීතයට සාපේක්ෂව වර්තමානය වන විට විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණවල ආයුකාලය ද අඩුවෙමින් පවතී. මෙම තත්වය හමුවේ ජනනයවන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය ප්‍රමාණය සැලකියයුතු ලෙස ඉහළයාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. සියලුම විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපාංගවල රසදිය, ඊයම්, කැඩ්මියම්, ඇන්ටිමනි, බෙරලියම්, ආසනික් වැනි බැර ලෝහ වර්ග හා වෙනත් විවිධ වූ විෂ රසායනික අඩංගුවන බැවින් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කළහොත් මිනිසාගේ සෞඛ්‍ය තත්වයට මෙන්ම සත්වයින්ගේ පැවැත්මට ද පරිසරයට ද හානි පමුණුවයි. විශේෂයෙන්ම මෙම විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍යවල අන්තර්ගත වන බැර ලෝහ සහ අනෙකුත් උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය විවිධ ක්‍රම මගින් ගංගා ජලය සමඟ මුසුවන බව පර්යේෂණ අනුව තහවුරුවී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍යමය සහ පාරිසරිකමය වශයෙන් බරපතල හානිකර තත්වයන් ඇතිවේ. එම තත්වයන් ද සිහිපත් කිරීම අරමුණු කර ගනිමින්, "විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ගංදිය රැකුමෙන් මිහිලිය රැකගමු" යන තේමාව ඔස්සේ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සඳහා වන මෙවර වැඩසටහන ක්‍රියාවට නැංවීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් කටයුතු කරන ලදී.

බස්නාහිර පළාතේ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ වැඩසටහන පිළිබඳව දැනුම්වත් කිරීමේ මාධ්‍ය හමුව මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේ දී 2022 ජනවාරි මස 25 දින පෙ.ව. 9.30 සිට පරිසර අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් ද අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා, මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති එස්. අමරසිංහ මහතා, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පී. බී. හේමන්ත ජයසිංහ මහතා ඇතුළු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ද පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

එස්. අමරසිංහ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය

"බස්නාහිර පළාත තුළ ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික
අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන"
2022 ජනවාරි 28 සිට 29 දෙදින

## එකතු කරන සහ එකතු නොකරන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය ලැයිස්තුව

### එකතු කරන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය

01. රූපවාහිනී යන්ත්‍ර
02. කැසට් යන්ත්‍ර/රේඩියෝ යන්ත්‍ර
03. විදුලි පංකා
04. පරිගණක/ ලැප්ටොප්
05. මොනිටර් (LED, LCD, CRT)
06. ජංගම දුරකථන සහ උපාංග
07. ස්ථාවර දුරකථන
08. ෆැක්ස් යන්ත්‍ර
09. ඇඹරුම් යන්ත්‍ර (බ්ලෙන්ඩර් සහ ග්‍රයින්ඩර්)
10. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික සෙල්ලම් බඩු
11. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික ක්‍රීඩා භාණ්ඩ/ විද්‍යුත් ව්‍යායාම උපකරණ
12. ටෝනර් කාට්‍රිජ්
13. රයිස්කුකර්
14. මුද්‍රණ යන්ත්‍ර (ප්‍රින්ටර්)
15. බැටරි (මෝටර් රථ/ යතුරුපැදි/ ජංගම දුරකථන/ ඔරලෝසු)
16. CD/ DVD යන්ත්‍ර
17. CD සහ DVD තැටි
18. විදුලි කේතල/ විදුලි හීටර
19. විදුලි උඳුන්
20. නොකැඩුණු CFL බල්බ
21. LED බල්බ
22. ප්‍රතිදීප්ත බල්බ (ටියුබ් බල්බ)
23. රෙදි සෝදන යන්ත්‍ර
24. ශීතකරණ
25. වායු සමීකරණ
26. වෙනත් ඉලෙක්ට්‍රොණික උපකරණ

### එකතු නොකරන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ

1. කොටස් කර ඇති හෝ අභ්‍යන්තර කොටස් ගලවා ඇති උපකරණ
2. පස්, වැලි හා මඩ තැවරී ඇති උපකරණ
3. කර්මාන්තායතන, වෙළෙඳසැල් මඟින් විශාල ප්‍රමාණවලින් ගෙන එනු ලබන විද්‍යුත් අපද්‍රව්‍ය